# මගේ උරුමය සමඟින් ප්‍රතිරාව නගන ඕසී පුරයේ සිංහල ගීතය

ඔස්ට්‍රේලියානු බහු වාර්ෂික ජන සංස්කෘතිය තුළින් බිහිවෙන සිංහල උප සංස්කෘතියේ පළමුවෙනි පිම්ම වන මගේ උරුමය මියුරු ගී සංයුක්ත තැටිය එහි ගායකයා වන බ්ලැක්ටවුන් සිංහල පාසලේ ශිෂ්‍යයෙකු ලෙස ඉගෙනුම ලබන නිසල් පාදුක්ක විදාන විසින් මෑතකදී මෙහි වෙසෙන අපේ ශ්‍රී ලාංකිකයන් වෙත පුදනු ලැබීය. නිසල් ශ්‍රී ලාංකාවෙන් සංක්‍රමනය වූ දරුවකු නොවේ. ඔහු මෙරට උපන් සිංහල බස කතා කරන එය මනාව හසුරුවන ශ්‍රී ලාංකික දරුවෙකි. අප සිංහල ප්‍රජාව තුළ "පළමු පිම්ම" ලෙස මා ඔහුගේ "මගේ උරුමය" හඳුන්වන්නේ ඒ නිසාය. එසේම මෙරට උපන් එම දරුවා සිංහල ගී පදවැල් සිංහල සංගීතයට අනුව ගායනා කරන හෙයිනි. කුඩා කල සිටම සංගීතයට විශේෂ ඇල්මක් දැක්වූ දක්වන නිසල් ලාංකීය ගීත කලාව මෙරට මෙන්ම ලංකාව තුළත් කැන්දායාමට වෙහෙස දරණ ප්‍රතිභාවෙන් පිරි ළමා ගායකයෙකි.

ශ්‍රී ලාංකාවෙන් සංක්‍රමණය වී තම මව්බස රැක ගැනීමට උරදෙන කලා ශිල්පීන් අතරට නිසල් ගේ නමද එක් වීම සිංහල ප්‍රජාව ලැබූ වාසනාවන්ත අවස්ථාවක් බව මම දකින්නේ නිසල් වැනි දරුවන්ගේ ආභාෂය ලබා තවත් දරුවන් බිහිවීම අද අප ප්‍රජාව තුළද යුගයේ අවශ්‍යතාවයක් වන නිසයි. අපට බොහෝ සැඟවුණු හැකියාවයන් ඇති දක්ෂ දරුවන් සිටී. එම සැඟවුනු හැකියාවන් ඔපනංවාගෙන අපෙන් පසු මෙරට සිංහල පරපුරක් බිහි කිරීම අපේ යුතුකමක් සේම වගකීමකි. නිසල්ගේ මගේ උරුමයෙන් පෙන්වන්නේ එය නොවේද?

මෙරට තුළද සිංහල බස තවදුරටත් නොමැරී පවතින බවට ඔහු සහතිකයක් ලබා දී ඇත.

මගේ උරුමය තුළින් අපේ දරුවන්ට මෙන්ම වැඩිහිටියන්ට ද ආදර්ශනීය පණිවිඩයක් දීමට උත්සහ දරණ නිසල්ගේ බොහෝ ගී වලට පාදක වී ඇත්තේ දෙමව්පියන් විසින් ඔවුන්ට අහිමිකළ උරුමය සහ මව්රටින් ඈත්වී දිවි ගෙවීමට සිදුවූ තමා වැනිම දරුවන්ගේ කඳුළු වැල් ගොන්නයි. තම රටේ සුන්දර මිහිරියාව ලබන්නට පින් නොකළ දරුවන්ගේ කඳුල ඔහුගේ ගී සමඟින් ගලා හැලෙන්නේ අපේ හදවත් අවදිකරමිනි. තෝරාගත යුත්තේ කුමන උරුමයද යන්න අපට කියාපාන ඔහු දෙමව්පියන්ගෙන් ප්‍රශ්න නගන්නේ ඒ උරුමය ඉල්ලාය. එසේම හරයක් නොමැති ගී ගායනා කරමින් රසාස්වාදවය මොට කරන ශ්‍රී ලාංකාවේ සමහර නව පරපුරේ ගායක ගායිකාවන්ට ද ළමා ගීත කලාවේ අපූරු සන්ධිස්ථානයක් වන මගේ උරුමය ශ්‍රී ලාංකා නාලිකා තුළද ප්‍රචාරය කළ යුත්තේ එහෙයිනි.

වර්තමාන අප මව්බිම තුළ ළමා ගීත සාහිත්‍යයක් නොමැති තරම්ය. 60,70 දශකයේ ළමා පරපුර ගායනා කළ ගීත අදටත් ජනප්‍රිය වී ඇත්තේ එහෙයිනි. ඒවාද කෙමෙන් මැකී යන මේ වකවානුවේ ළමුන්ගේ ගී පද වෙනුවට ළමුන් ගයන්නේ වැඩිහිටියන්ගේ ගීතයි. හතු පිපෙන්නාක් මෙන් මතු වූ ගුවන් විදුලි නාලිකා තුළින් ද අද ළමා ගීයට තැනක් ඉතිරි වී නොමැත. සූර්ය අරණේ "ඉරෙන් හඳෙන්" හා සමනල තටුහි "මේක සොඳුරු ලෝකයක්" චිත්‍රපට ගීත හැරුණු කොට මෑත කාලයක දරුවන්ගේ මනසට ගෝචර වූ නිසල්ගේ මගේ උැමය ගීත මිහිර , පිපාසයට දිය දෝතක් බඳුය.

ඔහු මේ තුළින් ගයන සෑම ගීතයක් තුළම නැවුම් බවක් හා අපූර්ව බවක් ඇත. පාසැලේ ප්‍රසංගයේ දුටුගැමුණු කෙනෙකු වීමට අකමැති දරුවා අඬාවැටෙන්නේ එළාර ලෙස රඟන දයාලන් පංතියේ ගජ මිතුරා නිසාය. ඔහු ගුරුතුමාගෙන් ඉල්ලා සිටින්නේ දුටුගැමුණු නාටකයේ එළාරවත් දුටුගැමුණුත් යාළු කරදෙන ලෙසය. ළමැද ලේ කිරට හරවා තමා රැකගත් මව සමඟ ගයන ලයාන්විත රිද්මය තුළින් මව හා දරුවා අතර සබැඳියාව සදාතනික බව මිහිරිව ගයන්නේ අපේ හදවතේ ගැහෙන රාවය ද එයට බද්ද කරමිනි. දරුවන්ගේ ආදරයට මවටත් පියාටත් එකම බව කියන්නේ දෙදෙනාම තමාගේ ආදරයේ නොවෙනස ගීතවත් කරමිනි. කුඩා කළ තමාට මව්රටේ දී පෙන්වූ බැබළෙන කිරි සඳ ගැන මව්ගෙන් ප්‍රශ්න කරන්නේ තමාගේ අනාගතය මව් රටේ ගොඩනග ා ගන්නට බැරි ඇයි දැයි ? අසමිනි. කම්සල වැඩපොළට රැකියාවට යන්නට අසන දරුවා කීයක් හරි හොයන්නට යන්නේ දෙමව්පියන් රැ කගැනීමටය. බොහෝ දරුවන් දුගී බව නිසාම කුළී වැඩවලට පෙළඹෙන ආකාරය සාර්ථක ලෙස අර්ථ ගැන්වී ඇති එම ගීය නිසල් ගයන්නේ අපේ ඇහැටද කඳුලක් එක් කරමිනි. පරිසරය,

ශ්‍රී ලාංකාවෙන් සංක්‍රමණය වී තම මව්බස රැක ගැනීමට උරදෙන කලා ශිල්පීන් අතරට නිසල් ගේ නමද එක් වීම සිංහල ප්‍රජාව ලැබූ වාසනාවන්ත අවස්ථාවක් බව මම දකින්නේ නිසල් වැනි දරුවන්ගෙ ආභාෂය ලබා තවත් දරුවන් බිහිවීම අද අප ප්‍රජාව තුළද යුගයේ අවශ්‍යතාවයක් වන නිසයි. අපට බොහෝ සැඟවුණු හැකියාවයන් ඇති දක්ෂ දරුවන් සිටී. එම සැඟවුනු හැකියාවන් ඔපනංවාගෙන අපෙන් පසු මෙරට සිංහල පරපුරක් බිහි කිරීම අපේ යුතුකමක් සේම වගකීමකි. නිසල්ගේ මගේ උරුමයෙන් පෙන්වන්නේ එය නොවේද?

සොබාදහස, පිය සෙනෙහස සිංහල පාසල ආදී ප්‍රස්තුතයන් අළලා රචනා වී ඇති ගී 14කින් සමන්විත මගේ උරුමය ගී තැටිය වෙනුවෙන් ශ්‍රී ලාංකාවේ අනුග්‍රහය ප්‍රතිභාපූර්ණ කලාකරුවන් සේම මෙරට වෙසෙන අපේම කලාකරුවන් කිහිප දෙනෙකුද දායක වී ඇත.

රෝහණ වීරසිංහ, සංගීත් වික්‍රමසිංහ, සුරේෂ් මාලියැද්ද, තිස්සසිරි පෙරේරා, වික්ටර් රත්නායක, රෝහණ ධර්මකීර්ති, මහින්ද බණ්ඩාර වැනි ප්‍රවීන සංගීතඥයන්ගේ නාද රටාවලින් ද නෙලූ අධිකාරී, ධම්මිකා වල්පොල වික්ටර් රත්නායක යුග ගායනයෙන්ද මෙරට සහ සිරිලක දක්ෂ ගේය පද රචකයින්ගේ ගී පදවැල්වලින් ද පරිපූර්ණ වී ඇති මගේ උරුමය නිසල්ගේ කටහඬ තුළින් රසාලිප්ත ගී දිය දහක් බවට පත්වී සයුරෙන් මෙතෙරට ගලාවිත් අපේ සවන් පිනවීමට හැකිවීම කෙතරම් සොඳුරු ආශ්චර්යක්ද ! මගේ උරුමය අපේ දරුවන්ගේ සවනට ලබාදිය හැකි සුන්දරම තෑග්ගක් බව මගේ විශ්වාසයයි.

නිසල් ඔබට සුභ ගමන් !

ලක්ෂමන් කොඩිතුවක්කු

